# ස.ණ.ස. පුවත් කොළඹින්

coop

2019 - ඔක්තෝම්බර් - දහවන කලාපය

දායකත්වය රු 15/-





සෝමලතා අමරසිංහ

04 පිටුව.. තීරක තීන්දු බලගැන්වීමේදී මතුවන අභියෝග



ලයනල් ගුණරත්න




බී.ජී. මධුභාෂිණී.

# සමුපකාරයේ සියලුම වැඩ ගැන බලය තියෙන්නේ සාමාජිකයින්ගෙන් යුත් මහා සභාවටය.

පවත්නා පනත් හා ප්‍රඥප්ති අනුව සමුපකාර සමිතියක් ලෙස ලියාපදිංචි කළ යුතුබවට තීරණය කරනු ලබන්නේ එම සංවිධානය සමුපකාර ප්‍රතිපත්ති වලට හා සාරධර්මවලට අනුකූලව පවත්වාගෙන යනු ලබන්නේ නම් පමණි. ස්වේච්ඡාවෙන් සංවිධානය වී සිය මහා සභා රැස්වීම් පැවැත්වීමේ දී සාමාජික ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යන ප්‍රතිපදාව අනුව කටයුතු කළ හැක්කේ බාහිර පාර්ශ්වයන්ගේ මැදිහත්වීමක් නොවන විටදීය. සමිතියක සිය මහා සභාව පැවැත්වීමේ අයිතිය එම සංවිධානයට හිමිවන නිසා, ඔවුනට එය ස්වාධිනව ස්වෛරීයව පැවැත්වීමට අවකාශ හිමිවිය යුතුවේ. සෑම මහා සභා රැස්වීමක් පැවැත්විය යුත්තේ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් මෙන්ම සාමාජික නොවන්නන්ගේ මැදිහත්වීමෙන් නම් සාමාජිකයාට ස්වාධීනව මත පළ කිරීමට හෝ මහා සභාවට තීරණ ගැනීමට හෝ බලපෑමක් වන බැවින් එවැන්නක් සමුපකාර ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීමක් මෙන්ම එය සාමාජික සංවිධානයක් හෝ සේවේච්ඡා සංවිධානයක් හෝ වන්නේ නැත.

## රෙජිස්ට්‍රාර් උන්නාන්සේට නොවේ.

ඩබ්.කේ.එච්.කැම්බල් - සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

1930.10.01 දින සමුපකාර වෙනමම දෙපාතීමේන්තුවක් බවට පත්කරමින් එහි ප්‍රථම රිජිස්ට්‍රාර්වරයා වූ ඩබ්ලිව්.කේ.එච්.කැම්බල් මහතා විසින් ජනතාව දැනුවත් කිරීම සඳහා නිකුත් කළ ප්‍රශ්නොත්තර මාලාවෙන් සමුපකාරයේ නිදහස හා අයිතිය ගැන පැහැදිලි කළ ප්‍රශ්න කිහිපයක් හා හා පිලිතුරු මෙහි සදහන් කරමි.

07 පිටුවට...

# වන්දනා හා විනෝද චාරිකාව



නැගෙනහිර ඇරැව්වල අංක 2 සණස සමිතියේ විනෝද හා වන්දනා චාරිකාව පසුගියදා දෙදිනක් පුරා සිදුකරන ලදී. හග්ගල උද්භිත උද්‍යානය, ග්‍රෙගරි වැව, වික්ටෝරියා උද්‍යානය, අඹේවෙල කිරි නිෂ්පාදනාගාරය, බදුල්ලේ දුන්හිද ඇල්ල, මුතියංගන රජමහා විහාරය යන ස්ථාන චාරිකාවට ඇතුලත් විය. ළමා සාමාජිකයන්ද ඇතුලුව 54 ක පමණ පිරිසක් මෙයට සහභාගි වූහ.

යු.ඩී.එස්. වීරසිංහ

# සී.ස. කොට්ටාව දකුණ සණස කාන්තා සමිතියේ 63 වන සංවත්සරය සැමරූ වගයි.




ප්‍රධාන ආරාධිත දේශණය පවත්වන ලද්දේ කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ ගරු සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩී. වීරසූරිය මැතිතුමන් විසින්. අප සමිතියේ අතීත සභාපතිනියන් සිහිකරමින් එතුමියන්ගෙන් සණස ව්‍යපාරයට සිදුවු සේවය අගයමින් හරවත් දේශණයක් සිදුකරන ලදී. එසේම වර්තමානයේ සමිතියේ දියුණුව අනෙකුත් සණස ව්‍යාපාරයන්ට ආදර්ශයක් වන්නාවු සමිතියක් වශයෙන් ඉදිරියෙන් සිටින බවත් හොඳ කළමනාකාරිත්වය එයට ප්‍රධාන හේතුව බවද පැවසීය.

සංගමයේ ගරු උපසභාපති එම්.ඒ.එස්. පෙරේරා මහරගම කලාපයේ ගරු සභාපති ප්‍රේමරත්න මනතුංග යන මැතිතුමන් සහ මහරගම කලාප සම්බන්ධීකරණ ලේකම් නිලන්ති සුදසිංහ මහත්මියන්ද සභාව අමතමින් සාමාජිකාවන් දැනුවත් කරන ලදී.

කුලසෙවණ සණස සමිතියේ ගරු සභාපති බටගොඩ මහත්මියද, කොට්ටාව අන්‍යොන්‍යාධාර සමිතියේ ගරු සභාපති අශෝක විජේනායක මහතාද උත්සවය සදහා සහභාගිවිය. වසරක් පුරා අඛණ්ඩව පැමිණි සාමාජිකාවන් 50 දෙනෙකුට ඇගයීම් ත්‍යාග පිරිනමන ලදී. තවද ගරු සභාපතිනියගේ හා කළමනාකාරියගේ සේවය අගයමින් තරුණ කමිටුව මගින් සමරු තිළිණ ප්‍රදානය කරන ලදී. තවද වසර 15ක් පැරණි සාමාජිකාවන්ට සහ සේවක මණ්ඩලය සදහාද සමිතිය විසින් ඇගයීම් ත්‍යාග ප්‍රදානය කරන ලදී.

07 පිටුවට...


AIR CONDITIONED
SADEEPA RECEPTION HALL
වායු සමීකරණය කල
සදීපා උත්සව ශාලාව
PLEASE INQUIRE FOR ALL YOUR FUNCTIONS
ඔබගේ සියළුම
උත්සව කටයුතු සඳහා විමසන්න.





ස.ණ.ස. සාමාජිකයින් සඳහා විශේෂ අයකිරීම්
පාසැල් මාවත, තලවතුගොඩ, පන්නිපිටිය.
විමසීම්: 0112774238/ 0113883837


# සකසුරුවම් මාසයේ ඉතිරි කරමු සුමිතුරේ.

සකසුරුවම් මාසය මුලික කරමින්
සකසුරුවම්කම පිළිබඳ ප්‍රබෝධයක් ඇති කරනු වස්
ඔබට අවැසි සැමට හිතැති සණස සමිතිය සමඟ
ගණුදෙනු කරමින් ඉහල ප්‍රතිලාභ අත්විඳින්න



ඔබ සැමට කෙරෙන ගෞරවනීය ආරාධනා

# යුතුකම වන්නේ රැකබලා සැමරුම්ය.



සැමරුම් දින අතර ලොව, සෑම රටකටම පොදු සැමරුම් දිනයක් වු ඔක්තෝම්බර් 01 දිනය ලෝක ළමා පරපුරට හා ලොව දිනූ වැඩිහිටියන්ට විශේෂ වේ.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව වයස අවුරුදු 18ට අඩු සෑම කෙනෙක්ම ළමයෙකු ලෙස අර්ථ ගන්වා ඇත. රටක තීරණාත්මක අනාගත සාධකය වන්නේද ළමයායි. එහෙයින් වැඩිහිටි ප්‍රජාවගේ වගකීම හා යුතුකම වන්නේ ඔවුන්ව සුරක්ෂිතව ආරක්ෂා කරමින් රැකබලා ගැනීම වේ.

දසක හයකට හතකට පෙර ළමයාගේ ජීවිතය නිදහසේ පියඹා යන සමනලයෙකු සේය. ගහ-කොළ ඇළ-දොළ, වැව්-අමුණු, සතා-සීපාවා, ගංගා-දියඇලි, ස්වාභාවධර්මයට බැඳී තිබුනද, වර්තමානයේ එම තත්වය වෙනස් වෙමින් ක්‍රමයෙන් බැහැර වී ඇත. ස්වාභාව සෞන්දර්ය සමග ජීවත් වු ළමයා, වර්තමාන තාක්‍ෂණයේ දියුණුවත් හා එක්ව ළමා දිවිය පරිගණකය වටා සීමා වී තිබේ. තවත් බේදවාචකයක් වී ඇත්තේ ළමයා උපකාරක පංතිවලට සීමා වී තරඟකාරී අධ්‍යාපන රටාවට හුරුව පාසැල් කටයුතුවල නියැලීමයි. මෙම හේතුන් නිසා පවුලේ බැදීම, ළමයා වෙන්කරමින් තනිව පවතී.

පුද්ගලයෙකුගේ අනාගතය තීරණය කරනු ලබන ළමා කාලය, නිදහසේ තීරණ ගැනීමට, අදහස් ප්‍රකාශ කිරීමට ඔහුට අවස්ථාව ලබාදිය යුතුව ඇත. එහෙත් අතීත දරුවෙකුට තිබූ එම ස්වාධීනත්වය වර්තමානයේ නොමැති වීම අභාග්‍යයකි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය අනුව, ක්‍රීඩා කිරීමට, විනෝදවීමට, සංස්කෘතික හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් හී යෙදෙමින් නිදහසේ ළමයාට ජීවත්වීමට පූර්ණ අයිතියක් ඇති අතර, වැඩිහිටි ප්‍රජාවගෙන් දෙමාපියන්ගෙන් ඒ සදහා ඔහුට හෝ ඇයට පහසුකම් හා මග පෙන්වා දායකත්වය ලබාදිය යුතුවේ.

වයස අවුරුදු හැට ඉක්ම වත්ම, සිරිලක ජ්‍යේෂ්ඨ පුරවැසියන් රජයේ නීතිමය පිළිගැනීම මත, පහසුකම් හා සුභ සාධනය සළසා දී ආරක්‍ෂා කළ යුතුව ඇත. පවුලේ ඥාතීන් අතර දෙමාපියන්ට දාව ඉපදුන දරුවන් විසින් මවටත්, පියාටත් ජීවත් වීමට පරිසරය සේම මූල්‍ය දායකත්වයද ලබාදිය යුතුවේ.

එහෙත්, දරු සෙනෙහසින් ඔද වැඩුනු දෙමාපියන් තම ජීවිත වලට ඇති අවදානම කිසි විටෙක නීතියට පෙන්වා නොදී, දුකදරා ගෙන ජීවත් වේ. පවතින රජයකට ඔරොත්තු නොදෙන තත්වයක් 2025න් පසු වැඩිහිටියන් නිසා උදාවන බව සංවර්ධන ක්‍රියා වලියට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යා ලේඛණ මගින් පෙන්වා දී තිබේ. ඉබි ගමනක යෙදෙන සැළසුම් වැඩිහිටි අප්‍රසාදයට ලක්වනු නොඅනුමානයි.

සැමරුම් උත්සවය නොව, ළමුන් සුරක්ෂිත කරවා හෙට දවස ඔවුන්ට භාරදීමටත්, රටක් පවත්වා ගෙන තම දා බිඳු හෙළු වැඩිහිටියන්ට මානසික සහනය හෝ අඩු තරමේ ලබාදීමට සමුපකාරයද උපයෝගී කර ගනිමින් ව්‍යාපෘති හා සැලසුම් එළි දැක්වීමට මතක් කර දීම අපේ යුතුකමකි.

**ස.ණ.ස. පුවත් කොළඹින්**

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
සී. ගමගේ
එම්.ඩී. ජිනදාස
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
220/1, හයිලෙවල් පාර, මහරගම.
දු.ක. 0112 851213, 0112 848801, 0114 301228
sanasacolombo@gmail.lk

# අභියෝගයන් හමුවෙහි, නොසැලෙන ලක් මවුතුම්යණි



ඉතා දිගු පෞඩ ඉතිහාසයකට උරුමකම් කියන ලක් මෑණියන්, 'විජය - කුවේණි' වෘතාන්තයෙන් සිය ගමන් මග අරඹයි.

මෙම යුගයේ පැවති, එඩිතර එසේම ප්‍රතාපවත් වූ ද, පාලන තන්ත්‍ර නිසා ලංකාව ලොව තුල සුපතල විය. එසේම ඉමහත් ගෞරවාදරයට ද පත්විය.

'ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මුතු ඇටයයි' යන, විරුදාවලියෙන්, පිදුම් ලද්දේ ද මේ නිසාමය. කාලය ගතවිය. රටේ තිබු පාලන තත්වය, දැඩි ලෙසින්, අස්ථාවර තත්වයට පත්විය. අවස්ථාවෙන් උපරිම ඵල නෙලාගත්, 'කාලිංඝමාඝ' නමැති ද්‍රවිඩ පාලකයා, ලංකාව ආක්‍රමණය කොට, බලය සියතට ගන්නාලදී. ඒ වර්ෂ 1215දීය. මෙතුමා ඉතාම බලවතෙකු වු අතර, ඉතාමත්ම කෲර වූද, පාලකයෙකි.

සම්බුද්ධ සාසනය ඉතා විශාල ලෙසින් විනාශයට ලක් කල, මෙතුමා බෞද්ධ භික්‍ෂුන් වහන්සේලාට, දැඩිලෙස හිංසා කළ අතර, වෙහෙර, විහාර බිමට සමතලා කරන ලදී. අහිංසක ජනතාවට, අධික බදු පනවා හිරිහැර කරන ලදී.

ඉන් අනතුරුව, ලංකාද්වීපයේ බලය සියතට ගන්නා ලද්දේ ලන්දේසි පෘතුග්‍රීසි හා ඉංග්‍රීසි පාලකයින් විසිනි. ඔවුන්ද, 'කාලිංගමාඝ' නමැති ද්‍රවිඩ රජු අනුගමනය කරණ ලදී. ඉසිලිය නොහැකි බදු ජනතාව පිට පැටවු අතර, බෞද්ධ සාසනය විනාශය සදහා කටයුතු සලසන ලදී. දිගින් දිගමට තාඩන පීඩන වලට මුහුණ දුන් එඩිතර, එමෙන්ම බුද්ධිමත් සිංහල ජන නායකයින්, ඒකරාශිවී නිභඩ විප්ලවයක් දියත් කරන ලදී. මෙහි ප්‍රතිඵලය වූයේ, ලේ බිදුවක් හෝ නොසොල්වා 1948 වර්ෂයේ පෙබරවාරි මස 04 වන දින ලක් මාතාවට නිදහස ලබා දීමයි.

1971 අප්‍රේල් මස සිදුවු 'ජනතා විමුක්ති පෙරමුනේ' බල අරගලය ද අති භයංකර වූවකි. උගත්, බුද්ධිමත් තරුණ, තරුණියන් රාශියකගේ දිවි තොරවු, අතර ආරක්‍ෂක හමුදාභට පිරිසද, විශාල වශයෙන් ජීවිතය පුදන ලදී. සිදුවු දේපල විනාශයද, අසීමිතය.

දසක තුනක පමණ දිගු අතීතයක් සහිත 'කොටි ත්‍රස්තවාදය' අනතුරුව නැගී එන ලදී. මෙයින් කොටිත්‍රස්තවාදීන් විශාල සංඛ්‍යාවක් ද, ආරක්‍ෂක හමුදාවේ විශාල භට පිරිසක්ද, ජීවිත පූජා කරන ලද අතර, අත,පය, අහිමිවූ පිරිස ද, අති විශාලය. සිදුවු දේපල හානියද, අපමණය. එවකට පැවති රජය, ආරක්‍ෂක හමුදාවෙහි, අප්‍රතිහත ධෛර්‍යය මධ්‍යයේ, එම අභියෝගයද, ජයගන්නා ලදී. වර්තමානයේදී එම ත්‍රස්තවාදයේ අදුරු සේයාපට නැගී සිටින බවද, අවධාරණය කරනු කැමැත්තෙමි.

2004 දෙසැම්බර් මස 26 වන දින මුළු ලොවම කළඹවමින් සුමාත්‍රා දූපත හරහා ඇදී ආ 'සුනාමි ව්‍යසනය' සිදුවිය. ඉන්දුනිසියාවද, මෙම ව්‍යසනයේ ගොදුරක් බවට පත්විය. බාල තරුණ, මහළු ජීවිත දහස් ගණනින් මෙම දරුණු රළ පහරට අසුවී ජීවිත වලින් වන්දි ගෙවන ලදී. දහස් ගණනින් ජීවිත පුරවා ගත්, දුම්රියක් පවා, මෙම දරුණු රළ පහරින් විනාශවීම මෙහි භයංකාරත්වය කදිම උදාහරණයකි.

2016 ජුනි මස 06 වන දින, අවිස්සාවේල්ල, සාලවත්ත, ප්‍රදේශයේ ඉදිකර තිබු යුධ හමුදාවට අයත්, අවි ආයුධ සහිත ගබඩා සංකීර්ණයයක් පිපිරීයාමෙන් දරුණු විනාශයක් සිදුවිය. දේපළ හා පරිසර හාණිය අති විශාල වු අතර ජීවිත හානි කිසිවක් සිදු නොවීම විශේෂ සිදුවීමකි.

2017 වර්ෂයේ, කොළඹ මීතොටමුල්ල ප්‍රදේශයේ ගොඩගසා තිබු, කුණු කන්ද, නායයෑම සිදුවිය. අහිංසක ජන ජීවිත 20-30 අතර ප්‍රමාණයක්, ලක්මවට අහිමිවිය. සිදුවු දේපළ හා පරිසර හානිය අති ප්‍රබල විය.

ඉහත දක්වන ලද, සියළුම විනාශ හා අභියෝග අතර, වඩාත් ප්‍රබල වූයේ, 2019 අප්‍රේල් මස 21 වන ඉරුදින සිදුවු අයි.එස්.අයි.එස්. ත්‍රස්තවාදී ප්‍රහාරයයි. කිතුණුවන්ගේ පාස්කු ඉරුදින සිදුවු මෙම ප්‍රහාරය කොළඹ කොච්චිකඩේ පල්ලිය, කටාන පල්ලිය හා සංචාරක ව්‍යාපාරයට ඉවහල් වු ප්‍රධාන පෙලේ හෝටල් කිහිපයක් එල්ලකොට සිදුවිය. වටිනා මිනිස් ජීවිත 250ක් පමණ ලක්මවට අහිමිවිය. 500 කට අධික පිරිසකට අත්,පා, අහිමි වන තත්වයට පත්විය. සිදුවු දේපල හානිය, අති විශාලය. මෙම දරුණු ප්‍රහාරය නිසා, ක්‍රිස්තු ආගමට සිදුවු හානිය අති විශාලය. රටේ සංචාරක කර්මාන්තය අඩපන විය. ළමුනගේ අධ්‍යාපනය කටයුතු සෑහෙන ප්‍රමාණයකින් දුර්වලවිය. එදා සිදුවූ භීතිය, ත්‍රසය අද පවා ජනතාව තුලින් සම්පූර්ණයෙන් පහවගොස් නොමැත.

දැනට නීතියේ රැහැනට පත්ව ඇති සියළුම අන්තවාදී ත්‍රස්ත තරුණයන් පුනරුත්තාපනයට පත්කර යුතුය. මෙම නොමග ගිය උගත්, බුද්ධිමත් තරුණ පිරිස යහමගට ගැනීම සදහා ලෝක ජන මතයක් ගොඩනැගිය යුතුය. ජාතීන්, විවිධ ආගමිකයන් අතර සමගි සංහිදියාවක් ඇතිකල යුතුය.

ඈත අතීතයේ පටන් ලක්මවට, අත්විදින්නට සිදුවු සියළු අභියෝග විනාශ ජයගත් ලෙසින්, මෙම අයි.එස්.අයි.එස්. ත්‍රස්ත ප්‍රශ්ණය ගැටළුව විසදා ගැනීමේ යෝධබල යෝධ ශක්තිය ලක්මෑණියන්ට උදාවේවා පතමි.

වල්පොල සණස සමිතිය ප්‍රමුඛ සියළුම සණස සමිතිවලද සාමාජික සාමාජිකාවන් සියළුම දෙනාගේද, ආශිර්වාදය මේ සදහා යොමු වේවායි. මම ඉතසිතින් ප්‍රාර්ථනය කරමි.



**කේ.ඩී. ප්‍රේමචන්ද්‍ර**
**වල්පොල සණස සමිතිය**

# වාර්ෂික ධර්ම දේශණාව



සී.ස. පිටිපන උතුර කිරිබේරිය කැලේ සණස සමිතිය මගින් සංවිධානය කරනු ලැබූ සුමධුර ධර්ම දේශණාවක් පසුගියදා සමිති ශාලාවේදී පවත්වන ලදී.

ඇත්කඳුරේ සුමනසාර හිමි විසින් මෙම ධර්ම දේශණාව සිදු කරනු ලැබූ අතර සාමාජිකයින් හා ප්‍රදේශවාසීන් විශාල පිරිසක් ධර්මදේශණය සඳහා සහභාගි විය.

බුද්ධාලම්භන ප්‍රීතිය වඩවමින් මියගිය සමුපකාරිකයින්ට පිං අනුමෝදන් කිරීම, සාමාජිකයින් හා රටවැසියන් හට සෙත සැලසීම සඳහා අප සමිතිය විසින් ධර්මදේශණය සංවිධානය කරනු ලැබීය.

**සෝමලතා අමරසිංහ**
**පිටිපන උතුර කිරිබේරියකැලේ සණස ලේකම්**

# කැපකළ කාලය අගයමු

කාන්තා නායිකාවක් ලෙස සමාජයේ
කළ මෙහෙවර අගෙයි කාටත් මතක තියේ
නෝරා ද සිල්වා යන නාමය නිතර වැයේ
ශෝකය පළ කරමු මේ ලෙස කලාපයේ

ඇය අප කාන්තා කමිටුව සහ බැදෙමින්
සොය සොයා අවැසි දේ නිසාලෙස ඉටු කරමින්
නියමිත දේ කලා හැම යහපත වෙනුවෙන්
දැයකට වටී අගයමු උපහර පුදමින්

අපගේ කාන්තා නායක මුල් පුටුවේ
ඔබගේ නිහතමානී ගුණමයි දුටුවේ
නොමගේ නොයාමට දරුමල් පැල සිටුවේ
අපගේ කාන්තා ළමයින්ටම කොටුවේ

දස වසරක ඉහත වගකීමක් පවරා
දුන් ඔවදන අදත් මතකයි සිතෙහි පුරා
තන තුර අභරණයක් නොව ඔබ ඉන්න තුරා
අද ටත් එය රකිමි මම දිවි තිබෙන තුරා

කැප කළ සේවයද කාලය නිම වූවා
අප කළ කුසල් ඔබ අනුමෝදන් වේවා
උපදින මතු භවය සුගතියකම වේවා
සැප ඇත නිවන තුල පින කුසලය වේවා

**චන්ද්‍රානි සමරසිංහ**
**දෙහිවල ගල්කිස්ස කලාපය - අධ්‍යක්ෂිකා**

# වාර්ෂික චාරිකාව 2019

සී.ස. දකුණු රත්මලාන සණස සමිතිය 9 වන වරටත් සංවිධානය කරන ලද වාර්ෂික වන්දනාමය චාරිකාව මෙවර මහියංගනය අම්පාර දිඝාමඩුල්ල ප්‍රදේශ ආශ්‍රිතව සිදු කරන ලදී.

සාමාජික සාමාජිකාවන් 160ක් රැගත් බස් රථ තුනක් සහභාගිත්වයෙන් මහියංගනය විහාරස්ථානයට කප්රුක් පූජාවක් හා කිරිපිඩු පූජාවක්ද චෛතිහාසික දීඝවාපී චෛත්‍යයට ඖෂද පූජාවත්, අටවිසි බුද්ධ පූජාවක් ද සිදු කොට තවත් චෛතිහාසික සිද්ධස්ථාන රාශියක් වන්දනා කර ගන්නා ලදී. පුරා දින 3ක චාරිකාව අවසන් කොට සියලුම දෙනා සතුටින් නිවෙස් බලා පිටව ගියහ.

**කළමණාකරු**

# පොළිය හසුරුවන්නේ මහ බැංකුවයි

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීම, මුදල් පාලනය ඇතුළු සියලුම කටයුතු 1949 අංක 58 යටතේ පිහිටුවන ලද මහ බැංකුවට පැවරී ඇත. අප රට නිදහස ලබන විට ආර්ථිකය ශක්තිමත්ව පැවතුනි. ජපානයට පමණක් දෙවැනි වු විදේශ විනිමය හිමි රටක් බවට පත්විය. විනිමය දෙපාර්තමේන්තුව 1953 පිහිටුවන ලදී. බැංකු ගනුදෙනු ව්‍යාප්තවීම, විනිමය ගණුදෙනු පුළුල් වීම, ණය ගනුදෙනු නිසා ලියාපදිංචි වු මෙන්ම නොවු විවිධ මුල්‍ය ආයතන බිහිවන්නට විය. ණය දෙන ආයතන, උකස් ආයතන, ෆිනැන්ස්, ලීසිං, පෞද්ගලික බැංකු රට පුරා ව්‍යාප්ත විය. සක්විති, දඩුවම් මුදලාලි වැනි ජාවාරම් කාරයෝද බිහිවූහ. රටපුරා සමමිතික පොලී මට්ටමක් පවත්වාගෙන යාම, ආර්ථික විචලනයන්ගෙන් ආරක්ෂා කිරීම, මහ බැංකුවේ බලාපොරොත්තුවයි. ආර්ථික වර්ධනයේ උපාය මාර්ගයකි. පොළී අනුපාත අඩුකිරීම එංගලන්තය, ඇමරිකාව වැනි රටවල 2%, 3% මට්ටමට පොලී අනුපාතය පවත්වා ගනී.

මහ බැංකු අධිපති 2019 2 මුදල් ප්‍රතිපත්ති විවරණය ඉදිරිපත් කරමින් තැන්පත් පොලී අනුපාතය 8%, ණය පොලී 9%, ව්‍යවස්ථාපිත සංචිතය 5% ලෙස නියම කරන ලදී. 5%ක් වු උද්ධමනය 4.6% දක්වා පහළ දැමීය. වෙළඳ ශේෂ හිඟය අඩු කිරීමට, ආනයන අවම කිරීමටත්, අපනයන ඉහළ දැමීමටත්, කටයුතු කරන ලදී. 2019 ආනයන වියදම 27.6%කින් අඩුවූ අතර, අපනයන 7.2% කින් වර්ධනය විය. ආර්ථික වර්ධන වේගය 4%ක් විය. විවිධ ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුවද ලැබූ ප්‍රගතිය සතුටුදායකය.

ලියාපදිංචි සමුපකාර මුල්‍ය ආයතන සම්බන්ධව මහ බැංකුව සහනදායි පිළිවෙතක් අනුගමනය කරයි. සමුපකාර ණය දෙන සමිති පිහිටවුයේ 1906 දීය. මහ බැංකුව පිහිටවුයේ 1950දීය. දශක හතරකට වැඩි කාලයක් ණය දෙන සමිති පාලනය වුයේ ග්‍රාමීය ප්‍රභූ පංතිය අතුරින් බිහිවු ස්වෙච්ඡා නිලධාරින් මගිනි. 1926 සමුපකාර ව්‍යාපාරයේ සම රෙජිස්ට්‍රාර්වරයෙකු වු ඩබ්.එච්.කේ. කැම්බල් ප්‍රකාශ කලේ සමිති බලය මහ සභාවට අයිති බවත් ගමේ මුදල් ගමේම පැවතිය යුතු බවත්ය. පොලිය ආණ්ඩුවට ගෙවීමට වඩා ගමේ කෙනෙකුට ගෙවීම හොඳ බව, එතුමාගේ මතයවිය. ගම් ප්‍රදේශවල ජීවත්වන අයගේ අවශ්‍යතා හදුනාගන්නේ ඔවුන් මිස රජයේ නිළධාරින් නොවේ. විසදුම් ලබාගත යුත්තේ ගම්මුන්ගේ අත්දැකීම් සහ දැනුවත්භාවය තුලිනි. අතුරු ව්‍යවස්ථාවේ සදහන් වන්නේ කාරක සභා නිර්දේශ මත වරින් වර පොළිය මහ සභාව තීරණය කළ යුතු බවයි. බාහිර ආයතනයකින් ලබාගන්නා ණය සදහා එම ආයතනයේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. පිටස්තර ණය සඳහා එම ආයතනයේ පොලී ප්‍රතිශතය 4% ට ඉක්මවා වැඩි නොකළ යුතුය. පසුගිය වකවානුවේදී අත්තනෝමතික ලෙස පොලී අනුපාතය ඉහළ දැමීමෙන් මූල්‍ය අක්‍රමිකතා සිදුකළ ඇතැම් සමිති ගැන හෙළිදරව් විය. යම් සමිතියක් වැඩි ඉතුරුම් පොලියක් ගෙවන්නේ නම්, එම මුදල් ආයෝජනය කරන්නේ ඊට ඉහල ආදායමක් ලැබීම අපේක්ෂාවෙනි. එය අසාර්ථක ඉලක්කයක් වුවහොත් එකවර තැන්පත්කරුවන් මුදල් ඉල්ලා සිටීමෙන් සමිති කඩා වැටීමකට ඉඩ තිබේ. සමුපාකාරිකයන් වශයෙන් පොළි ප්‍රතිශත තීරණය කිරීමේදී අප වඩාත් බුද්ධිමත් අයුරින් කටයුතු කළ යුතුය.

**යූ.ඩී.එස්. වීරසිංහ**
**නැ. ඇරැව්වල අංක 2 සණස**

# පහල කොස්ගමින් වටිනා මෙහෙවර

**දැයේ සම්පත ඔබයි**

පහල කොස්ගම සණස සමිතිය මගින් වාර්ෂිකව ගැබිණි මාතාවන් උදෙසා පිරිනමන ලද උදෑසන පෝෂ්‍යදායක ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන දෙවන වරටත් කොස්ගම මාතෘ සායනයේදී සණස සාමාජිකයන්ගේ දායකත්වයෙන් සිදුකරන ලදී.

**වාර්ෂික පොසොන් දන්සල**

පොසොන් පොහෝ දින දෙනු ලබන කිරිකෝපි සහ බිස්කට් දන්සැල 20 වන වරටත් සමිති සාමාජික සාමාජිකාවන්ගේ දායකත්වයෙන් මෙවරද කොස්ගම නගරයේදී පවත්වන ලදී.

**වාර්ෂික චාරිකාව**

වාර්ෂික දෙදින චාරිකාව මෙවර කිරිවෙහෙර සහ කතරගම දෙවොල වන්දනා කරගැනීම සඳහා යොදා ගන්නා ලදී. එයට අමතරව මාතර උපුල්වන් දේවාලය, වෙහෙරහේන විහාරස්ථානය, උස්සන්ගොඩ සුන්දර මුහුදු තීරය, සෙල්ලකතරගම, කතරගම හම්බන්තොට කුරුළු උයන ආදී ස්ථාන වන්දනා කරගැනීම හා නැරඹීම සිදුකරගන්නා ලදී. ඒ සඳහා සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහ සාමාජික නොවන 60කට ආසන්න පිරිසක් සහභාගි වූහ.

**සාංඝික දානමය පිංකම**

හිටපු සභාපතිනි වයි.කේ. මුදලිගේ මහත්මිය මියගොස් වසර දෙකක් පිරීම නිමිත්තෙන් සහ සණස සමිතියේ මියගිය සියලුම සාමාජිකයින් හා නිලධාරින් හට පිං පැමිණවීම සඳහා සාංඝික දානමය පිංකමක් සිදුකරන ලදී. කොස්ගම ශ්‍රී සුදර්ශනා රාමාධිපති සුමනබැද්දේ වනරත්න නායක හිමිපාණන් ඇතුලු මහා සංඝරත්නය උදෙසා දන්,පැන්, පිරිකර පුජා කරන ලදී.

ඒ සදහා සමිතියේ සාමාජික හා සාමාජික නොවන අසල්වාසි සැමගේ නොමසුරු දායකත්වය ලබා දෙන ලදී.

**පී. නයනී වසන්ති පීරිස් - සහාය කළමනාකාරිනී - කොස්ගම සණස**

# සේවය අගයා



කොතලාවල සණස සමිතිය ආරම්භ කර වසර 90ක් වන අතර එම දිගු ඉතිහාසයේ වසර 33 ක නොකැලැල් සේවයක් ඉටුකල සහකාර කළමණාකාරිණි එස්.පී.ආර්. වාහලතන්ත්‍රි මහත්මිය විශ්‍රාම යාමේ උත්සවය පසුගියදා පැවැත්විණි.කොතලාවල සණස බැංකුවක් ලෙස ස්ථාපිත කිරීමේ වකවානුවේ සේවයට ඇතුල් වු එතුමිය ඉතාමත් දියුණු සමිතියක් ගොඩනැගීම සඳහා විශාල දායකත්වයක් ලබාදුනි.

සමිතිය විවිධ චෝදනා වලින් තොරව විශ්වාසනීයව හොද කීර්තිනාමයකින් යුතුව ගෙන යාම සඳහා දරන ලද මෙතුමියගේ උත්සාහය සැමරීමේ උත්සවයේදී ඉස්මතු වු කරුණකි. කොතලාවල සණස සමිතියේ සියළු දෙනාගේ සුභපැතුම එතුමියගේ ඉදිරි කටයුතු සාර්ථක වේවාය යන්නය......

**ලේකම් - කොතලාවල සණස**

ස්වයං විනයක් හා සංවරයක් ඇති සමුපකාර ප්‍රතිපත්ති සාමාජික අවශ්‍යතාවන් ඉටුකර දෙයි.

# තීරක තීන්දු බලගැන්වීමේදී මතුවන අභියෝග

සමුපකාර සමිතිවලට ණය වශයෙන් හෝ වෙනත් අයුරකින් අයකරගත යුතු මුදල් අයකර ගැනීම සදහා සමුපකාර පනත හා පළාත් ප්‍රඥප්තිවල දක්වා ඇති 58 වන වගන්තිය යටතේ විභාගයක් පවත්වා තීරණයක් ලබාදීමේ අධිකරන බලය සමුපකාර කොමසාරිස් වරයාවෙත ලබාදී තිබේ. පසුව මෙම බලය උප කොමසාරිස්වරුන් වෙතද ලබාදෙන ලදී. කොමසාරිවරයා විසින් ලබාදුන් තීරණයකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එසේ නොවුවහොත් නියමිත කාලය ඉක්මගිය පසු එය තීන්දුවක් බවට පත්වේ. එම තීන්දුව අනුව අදාල මුදල ගෙවීම තවදුරටත් පැහැර හරින්නේ නම් එය බලගැන්වීම සදහා පහත සදහන් ක්‍රියාමාර්ග අතරින් සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත.

1. දිසාපති/උපදිසාපති හෝ පිස්කල්/නියෝජ්‍ය පිස්කල් මගින් පැහැර හරින්නාගේ චංචල දේපල තහනමට ගෙන විකුණා මුදල් අයකර ගැනීම.

2. පැහැර හරින්නාගේ නිශ්චල දේපල තහනමට ගෙන විකිණීම සදහා දිසා අධිකරණය මගින් ඇස්කීසි නියෝගයක් ලබාගැනීම.

3. ප්‍රදේශයේ අධිකරන බලය ඇති මහේස්ත්‍රාත් අධිකරනය වෙත, යොමුකර අධිකරණය විසින් නියමකරන දඩමුදලක් වශයෙන් අයකර ගැනීම.

මෙම ක්‍රියාමාර්ග අතරින් එක් එක් ණයවර්ග සදහා මේ මේ ක්‍රියාමාර්ග අනුගමනය කළයුතු යැයි දැක්වෙන නිශ්චිත විධානයක්ද නීතියේ දක්වා නැත. එමනිසා දැනට බහුල වශයෙන් ක්‍රියාත්මක වන්නේ කොමසාරිස්වරයා විසින් නිකුත්කරන තීන්දු සහතිකය මහේස්ත්‍රාත් අධිකරණය මගින් බලගන්වා අධිකරනය නියමකරන දඩමුදලක් වශයෙන් එකවර හෝ කොටස් වශයෙන් ගෙවීමේ නියමය මගින් අයකර ගැනීම වේ. කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරන තීන්දු සහතිකයක් පිළිබදව නැවත අධිකරනය මගින් විමසා බැලීමද නීතිය මගින්ම වලක්වා තිබේ. එමනිසා ණය මුදල වෙනුවෙන් උගස්කරයක් හෝ චංචල දේපල ඇප වශයෙන් තිබුණද එවැනි ණය මුදලක් අයකර ගැනීමේ තීන්දු සහතිකයක් මහේස්ත්‍රාත් අධිකරනයට යොමුකළ නොහැකි බව දැක්වෙන නීතියේ විධානයක්ද නැති නිසා, ඕනෑම වර්ගයක ණයක් හෝ වෙනත් අයුරකින් අයකර ගතයුතු මුදලක් මෙම විධිවිධාන යටතේ අයකර ගැනීමේ බාධාවක් තිබිය නොහැක. 2010.2.5 දින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරනයේ අංක 4105/එස්/9 දරණ නඩුවේදී අයවිය යුතු රුපියල් ලක්ෂ 25ක මුදල රු ලක්ෂය බැගින්වූ වාරික 25කින් ගෙවීමට නියම කරමින් ලබාදී ඇති තීන්දුව එයට නිදසුනකි. අධිකරණය විසින් එසේ ගෙවීමට නියමකල යම් මුදලක් එක් වාරිකයකින් හෝ ගෙවීම් කඩකලහොත් පැහැර හරින්නාට එරෙහිව වරෙන්තු නිකුත් කර අත්අඩංගුවට ගතහැක. සමුපකාර මුදල් අයකර ගැනීමේලා හදුන්වා දී ඇති මෙම සුවිශේෂ නීතියේ පවත්නා ප්‍රබලතාවය එයින් වටහාගත හැකිවේ.

සමුපකාර සමිති අතරින් ස.ණ.ස. සමිති ණයලබා දෙන්නේ තම සාමාජිකයින්ගේ තැන්පත් මුදල් වලිනි. එසේ ලබාගත් ණය මුදලක් නොගෙවා පැහැර හැරීම මගින් එම සමිතිවල තැන්පත් මුදල් අවදානමට ලක්වී එමගින් සාමාජිකයින්ට හා එම සමිතිවලට විශාල අගතියක් සිදුවීම නොවැලැක්විය හැක. එමනිසා මෙවැනි විශේෂිත නීතියක් හදුන්වා දීම මගින් එම සමිතිවල පැවැත්ම මෙන්ම සාමාජික තැන්පත් මුදල් සම්බන්ධයෙන්ද මේ සාධාරණයක් ඉටුකිරීම නීති සම්පාදකයින්ගේද අරමුණ වූවා වියහැක. නමුත් තීරක තීන්දු බලගැන්වීමේදී වර්ථමානයේ මතුවෙමින් පවතින අභියෝග පිළිබඳවද වගකිව යුත්තන්ගේ අවධානය යොමුවිය යුතු තත්වයක් පවතී

නොබෝදා එක් සණස සමිතියක නොගෙවා පැහැරහරින ලද ණය මුදලක් අයකරගැනීම සදහා කොමසාරිස්වරයා විසින් අදාල තීන්දු සහතිකය හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයට යොමුකල විට විත්තිය වෙනුවෙන් හේතු දැක්වීම යටතේ නීතිඥවරයා මූලික විරෝධතා ගොනුකරමින් එම ණය මුදල සදහා දේපල උගස්කරයක් පවතින බවත්, ඒ අනුව උගස්ක්‍රියාවේ යොදවා ණය අයකර ගතහැකි බැවින් මහේස්ත්‍රාත් අධිකරණයේ බලගැන්වීම සාධාරණ නොවන බවත් ලිඛිත දේශණ මගින් පෙන්වා දෙන ලදී. මහේස්ත්‍රාත් අධිකරණයේ එසේ හේතු දැක්වීමට අවස්ථාව ඇතත්, එහිදී අධිකරණයට සළකා බැලිය හැකකේ පහත දක්වා ඇති හේතුන් පිළිබදව පමණි.

1. නඩුවට අදාල පුද්ගලයා තමා නොවන බව

2. ඒ වනවිට අදාල මුදල ගෙවා අවසන් කර තිබීම.

3. එම ගණුදෙනුව අදාල අධිකරණ බල ප්‍රදේශය තුල සිදුවූවක් නොවීම.

මෙම කරුණු සනාථ කිරීමට විත්තිකරු සමත් නොවේ නම් අදාල චෝදනාවෙන් ඔහුව නිදහස් කල හැකිනොවේ. මෙහිදී පැමිණිලිකරු වශයෙන් කොමසාරිස්තුමාද ඉහත කරුණු සමග අතීත නඩුවාර්තා කීපයක් ඇසුරෙන් තීන්දුවක් බලගැන්වීමේදී නීතියේ ප්‍රථිපාදන මගින් තමාවෙත පැවරී ඇති බලතල දක්වා ප්‍රතිවිරෝධතා ගොනුකල නමුත් ගරු විනිශ්චකාර තුමා ඒවා නොපිලිගෙන තීන්දුව ප්‍රකාශයට පත්කරන ලදී.

එම තීන්දුවේ දක්වා ඇති පරිදි උගස්කරයක් ලිවීමේ අරමුණ වන්නේ මුදල් නොගෙවීම මත උගස ක්‍රියාවේ යෙදවීමට බවත්, නමුත් එසේ නොකර, ඉක්මණින් මුදල අයකර ගැනීමේ අරමුන මත කොමසාරිස්වරයා ප්‍රඥප්තියේ ඇති වෙනත් බලයක් උපයෝගී කරගෙන මෙම සහතිකය ඉදිරිපත් කර ඇති අතර, එමගින් ස්වාභාවික යුක්ති මුලධර්ම උල්ලංඝණය වී ඇති නිසා එය අධිකරණයට පිළිගතහැකි වලංගු සහතිකයක් නොවන බව දක්වා ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. එමෙන්ම මෙම නඩුතීන්දුවේ දක්වා ඇති විශේෂිත සදහනක්ද වේ. එනම් සහතිකයක් මත මුදල් අයකර ගතහැකි නම් සමුපකාර සමිතිය විසින් උගස්කරයක් ලිවීමේ අවශ්‍යතාවයක් නැති බවයි.

තීන්දු සහතික මහේස්ත්‍රාත් අධිකරණයේ බලන්වා මුදල් අයකර ගැනීම දැනට බොහෝ කලයක සිට ක්‍රියාත්මක පවතී. නමුත් මෙම සහතිකය මහේස්ත්‍රාත් අධිකරණයේදී ප්‍රතික්ෂේප වීමේ අවාසි සහගත සාධකය වී ඇත්තේ සමිතිය විසින් ණය උගස්කරයක් ලියා තිබීමයි. නොඑසේ නම් එය බලගැන්වීමට අදාල වෙනත් සාධකයක් එම නඩු වාර්ථාවේ දක්වා නැත.

කෙසේ වෙතත් මෙම තීන්දුව සම්බන්ධයෙන් ඉහළ අධිකරණය වෙත ප්‍රතිශෝධන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබුණද පැමිණිලිකරු වශයෙන් කොමසාරිස් කාර්‍යාලයේ නිලධාරීන් ඒ පිළිබද උනන්දුවක් නොදැක්වූ නිසා සමිතිය විසින් සිවිල් නඩුවක් පවරා, එක් වාරිකයක් හෝ නොගෙවා පැහැර හැරියහොත්, දේපල ඇස්කීසි කිරීමේ කොන්දේසියට යටත්ව, සම්පූර්ණ මුදල කොටස් වශයෙන් ණයහිමි සමිතියට ගෙවීමේ පොරොන්දුව මත සමථයක් මගින් නඩුව අවසන් කරන ලදී. නමුත් මෙහිදී පැන නගින අතුරු ප්‍රශ්ණ කීපයක්ද වේ.

තීන්දු සහතිකය බලගැන්වීම සදහා කොමසාරිස් වරයාගෙන් ඉල්ලා සිටින්නේ ණයහිමි සමිතිය විසිනි. මෙම ලිපියේ දක්වා ඇති පරිදි ඒ සදහා අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග තුනක් නීතියේ දක්වා තිබේ. දේපල උගසක් පවතීනම් එය අනිවාර්යෙන්ම දිසා අධිකරණය වෙත පමණක්ම යොමුකල යුතුයැයි දැක්වෙන නිශ්චිත විධානයක් ද නීතියේ දක්වා නැත. එමෙන්ම දේපල උගසක් ක්‍රියාවේ යෙදවීම යනු සරළ කටයුත්තක්ද නොවේ. ඒ සදහා ඉදිරිපත් කළයුතු ලේඛණ සකස් කිරීම සදහා දැනුම ඇති කළමණාකරුවන් හෝ කාරක සභිකයින්ද සමිතිවල සිටිය යුතු වුවත් එවැනි දැනුවත් කිරීම්ද සිදුව නැත. එමෙන්ම අදාල විෂය පිළිබද දැනුම ඇති දෙපාර්තමේන්තු නිලධාරින්ද ඇත්තේ අල්ප වශයෙනි. එම නිසා ණය මුදලක් අයකර ගැනීමේදී, දේපල උගසක් පැවතියද ඒ සදහා ප්‍රඥප්තියේ දක්වා ඇති ක්‍රියාමාර්ග අතරින් වඩාත් සුදුසු ක්‍රියාමාර්ග අනුගමණය කිරීමට සමිතියක් තීරණය කළහොත් එය නීතියට පටහැණිවේද? එමෙන්ම එම ක්‍රියාමාර්ග අතරින් තම අභිමතයට අනුව සුදුසු ක්‍රියාමාර්ගයක් අනුව සහතිකයක් නිකුත් කිරීමේ අධිකාරි බලයක් කොමසාරිස්තුමාට නොතිබේද? නොඑසේ නම් එකී නඩු තීන්දුවේ සදහන් කර ඇති පරිදි සමුපකාර සමිතියක් ණය ලබාදීමේදී උගස්කරයක් ලිවීමේ අවශ්‍යතාවයක් නැද්ද?

සමුපකාර මුදල් අයකර ගැනීමේලා දැනට ක්‍රියාත්මක වන තින්දු බලගැන්වීමේ නීතිය සම්බන්ධයෙන් අතීතයේද මෙවැනි අභියෝග හා ගැටළු මතුවී තිබේ. එවැනි අවස්ථාවල එවකට සිටි ප්‍රවීණ නිලධාරින් ඒවා වහාම ඉහළ අධිකරණය වෙත යොමුකර ඒ පිළිබද පැහැදිලි කර ගැනීම් හා අදාල ආයතනවල මතය විමසීම් මගින් ඒවා නිරාකරණය කරගත් අවස්ථා සමුපකාර නීති ඉතිහාසයේ සදහන්ව තිබේ. එමගින් දැනට වසර 40 කට වැඩි කාලයක සිට ක්‍රියාත්මකව පවතින මෙම නීතියේ දැනට මතුවෙමින් පවතින මෙවැනි ගැටළු හා අභියෝග අදාල බලධාරීන්ගේ හා නීති සම්පාදකයින්ගේ අවධානයට යොමුවී නිරාකරණය වන්නේ නම් එය සමුපකාර ව්‍යාපාරයේ පැවැත්මට හිතකර වේ.

**ලයනල් ගුණරත්න**
**මුල්ලේගම සණස**

## තෙදින වන්දනා චාරිකාව

**බී.ජී. මධුභාෂිණි. කළමණාකරු**



සී.ස. ඕවිටිගම සණස සමිතියේ ගරු සභාපති යූ. ආනන්ද මහතා ජ්‍යේෂ්ඨ කළමණාකරු සුජීවා පුෂ්පකාන්ති මහත්මිය සහ ගරු කාරකසභා නිළධාරී මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කරන ලද තෙදින වන්දනා චාරිකාව පසුගියදා සාමාජිකයින් පනස්දෙනෙකුගේ සහභාගීත්වයෙන්, අම්පාර දිස්ත්‍රික්කය මුලික කරගෙන චාරිකාවේ යෙදෙන ලදී.



පළමුදින සෝමාවතී චෛත්‍ය වැදපුදා ගත් අතර ඉන්පසු පාසිකුඩා වෙරළ තීරය නරඹන ලදී. දෙවන දින බුද්ධංගල, සාම චෛත්‍ය, දීඝවාපිය, මුහුදු මහා විහාරය වැදපුදා ගෙන ආරුගංබෙ වෙරල තීරය නරඹන ලදී.

තෙවන දින රංකොත වෙහෙර, කුඩුම්බිගල, ඔකඳ දේවාලය, කොටවෙහෙර, යුදගනාව, මගුල්මහා විහාරය වැද පුදා ගනිමින් චාරිකාවේ කටයුතු සාර්ථකව නිම කරන ලදී.

# සත්‍ය ජීවනය කරා

සසර සැරි සරන අපි අසරණ වෙමු. බුදුන් වහන්සේද එම මතයේ පිහිටි සේක. අපිට පිහිටක් අවශ්‍යයි. ඒ කුමක් සදහාද? පිහිට යන්නෙහි අරුත දැන සිටීමෙන් ගැටළුව විසදා ගත හැක. පිහිටා සිටින තැන, පිහිට යන්නට කෙටිම පිළිතුරයි. ජීවිතයකට පදනමක් තිබිය යුතුයි.

සත්‍ය ජීවිතයක සතුට හා මුසු වු ස්වාධිනත්වය හා සැහැල්ලුව තිබිය යුතුය. එහෙත් අපගේ ජීවිත අසහනකාරියි. ගැටළු සහිතයි. තෘප්තිමත් බවක් නැහැ. ඒ නිසාම ජීවිත ව්‍යාජ බවට අසාරබවට පත්වේ. කළකිරීම් බහුල ජීවිතයකින් නිදහස් වීමට ගැටලුව හදුනාගත යුතුයි. නියම ස්වරූපය දැකිය යුතුයි. එවිට උපේක්ෂා සහගත වීම සිදුවේ. ලොව ස්වාභාවයේ සත්‍ය නොදැකීමෙන් කලකිරීමට අපි ගොදුරුවෙමු. සත්‍යය ස්පර්ශ වු සැනෙන්, ජීව ශක්තිය ලැබ ශෝක භය පලවා හරී.

ආධ්‍යාත්මික ජීවනය, ලෞකික ජීවනය වශයෙන් වෙන්කර ගැනීමෙන්ද, බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම්, ආගමික වශයෙන්ද බෙදීමෙන් අපේ ජීවිත පටු වී ඇති බව බොහෝ දෙනෙකුට වැටහී නැත. ජීවිතයේ යථාර්ථය දැකීම දුෂ්කරයි. එකිනෙකා වෙන් වෙන්ව තමන්ගේ ලෝකවල ජීවත් වෙති. පුද්ගලයෙකු දකින සත්‍යය, තමාගේ කර ගැනීමෙන් මංමුලා වී ඇත. ආත්මීය වශයෙන් දැඩි ග්‍රහණයට පත්වී සිටින තාක්කල් යථාර්ථයට පිවිසීම දුෂ්කරයි.

ජීවිතයක මානසික ශක්තීන් ඇතිවා සේම අධි මානසික ශක්තීන්ද ඇතිවේ. සිතට අරමුණක් ගැනීමෙන් අභිප්‍රේරණය සිදුවේ. නිර්මානාත්මක චින්තනය ඕනෑකම මත පිහිටයි. විභව ශක්තීන් උද්දීපනය වී අධිෂ්ඨානය වෙත යොමු වී නිර්මාණ බිහිවේ. මහත් කැපවීමෙන්, එකඟතාවයක් ඇතිව, විශිෂ්ඨ මට්ටමෙන් කිරීමට ගන්නා උත්සාහය තුලින් අධිමානසික ශක්තීන් අවදිවේ.

පැහැදිලි නිරවුල් සිහියෙන් සිටින විට සත්භාවය ඇතිවේ. දියුණුව සොයා යන්නෙකු යටි සිතෙන් තෘෂ්ණාව හෝ ආත්මාර්ථකාමී මග නොයා යුතුයි. සමුපකාරික අදහස් තුළින් ජීවන දැක්ම වටහා ගෙන අපිස් ජීවිතයකට පිවිසෙමු.

**හේමසිරි බෙනරගම**

# කාන්තා කමිටුව තුලින් කාන්තා නායකත්වයක් ගොඩනගමු


සණස සමිතියේ සාමාජිකයින්ගෙන් වැඩිපුර නියෝජනය වන්නේ කාන්තාවන්ය. සමිතිය තුල අඩු පිරිමි සංඛ්‍යාවන් සිටියත් හැමවිටම ඔවුන් ප්‍රධාන නිලතල වලට පත්වේ. දැනට රටේ උගතුන්ගෙන් 55%කට වැඩි කොටසක් සිටින්නේ කාන්තාවන්ය. විශ්ව විද්‍යාල වලට වැඩිපුරම ඇතුල්වන්නේ කාන්තාවන්ය. ගමේ සමිතියේ නායකත්වය කාන්තාවන්ට ඉඩ ලැබෙන්නේ නැහැ.

එසේ වන්නේ කාන්තාවන් නුගතුන් නිසා නොව ඔවුන් වැඩි පෞර්ෂත්වයක් නොපෙන්වීම නිසා බව පැහැදිලිය. අප ඉදිරියේදි එසේ වන්නට ඉඩ නොදිය යුතු අතර, අඩුම වශයෙන් තම දැනුවත් බව සමිතිය තුල ප්‍රකාශ කල යුතුවේ. එසේ කිරීමෙන් සමිතියට වාසිදායක තත්වයක් ලබාගත හැකිය. අඩුම වශයෙන් ක්‍රියාශිලි කාන්තා කමිටුවක් තුලින් තම දැනුවත්භාවය පිළිබිඹු කලයුතුයි. තමාගේ හැකියාවන් ඔප් නැංවීමට හොදම නැන පලාතේ සණස සමිතියයි. එසේ නොකල හොත් තමන්ගේ හැකියාවන් පෙන්වීමට අවස්ථාවක් ලැබෙන්නේ නැතිබව පෙන්වා දිය හැක. තමාටද එවැන්නක් කලහැකි බව සනාථ කරමින් ඉදිරියට පැමිනිමට කටයුතු කලයුතු බව පෙන්වා දිය යුතුයි. අවංකභාවය නායකත්වයක් දැරීමට හොදම කරුණ බවත්, එය කාන්තාවන් තරයේ සිතේ තබාගත යුතුය.

රැකියාවල නියුතු කාන්තාවන්ට කාර්ය බහුල වන නිසා සෘජුවම සම්බන්ධ වීමට මැලිකමක් දක්වයි. එසේ වුවත් ඔවුන් මද වශයෙන් හෝ ගමේ සණස සමිතියට සම්බන්ධවී කටයුතු කිරීමට සිතේ තබාගත යුතු අතර, රැකියාවල නිරත නොවන කාන්තාවන් සමාජ සේවයට ඉදිරිපත්වී තම හැකියාවන් පෙන්වමින් ගමේ සමිතියේ දියුණුවට ඉදිරිපත් විය යුතු යැයි මගේ අදහස. ඒ නිසා කාන්තාවන්ගේ පෞරශත්වය පෙන්වීමට මෙය මහඟු කාර්‍යයක් වේ යැයි මගේ අදහස.

**කේ.එච්.ඩී.බී. කාන්ති**
**සී.ස. මහරගම සණස කාන්තා කමිටු ලේකම්**

# නිරෝගිමත් සිරුරක් උදෙසා




උතුරු කටුබැද්ද සණස සමිතියේ සංවිධානයෙන් නුගා බෙස්ට් ආයතනයේ මෙහෙයවීමෙන් බෝනොවන රෝග සහ බාහිරෙන් පැමිණෙන රෝග වලක්වා ගැනීම සදහා ක්‍රියා කලයුතු ආකාරය හා ඔබ අත්විදිමින් පවතින අධික තරබාරුව, දියවැඩියාව, කොන්දෙ අමාරුව, හන්දිපත් වේදනාව, රුධිර පීඩනය මේදමය තත්වය අක්ෂි රෝග ඇතුළු සියළුම රෝග තත්වයන් අවම කර ගන්නා ආකාරය පැහැදිලි කරමින් ඉදිරියේදී එම රෝග වලින් බේරී සිටිම සදහා ඖෂධ භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජිවිතයක් සහ ශරීරයේ ඇතිවන රෝගාබාධයන් අවම කරගැනීම සදහා නවීන තාක්ෂණය මගින් ප්‍රිය මනාප නිරෝගිමත් සිරුරක් සදහා කොරියානු නිල ප්‍රතිකාරක්‍රමය නොමිගේ ලබාගැනීමට නුගා බෙස්ට් ආයතනය පහසුකම් සපයා ඇති බවත් පැමිණ වෙනස විදගන්නා ලෙස ප්‍රකාශ කලහ.

**නිමල් කොළඹගේ**
**උතුරු කටුබැද්ද සණස**
**වාර්තාකරු**

# මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

# කියවන්න... දැනුම ලබන්න....

## දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 නොවැම්බර් 14 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :- ජාත්‍යන්තර ළමා හා වැඩිහිටි දිනය සමරන්නේ කවදාද?**

## කුපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 08**

**සී.ස. ගලවිල මාලපල්ල සණස සමිතියේ**
**ආර්.එම්. විශාඛා බණ්ඩාර මිය**

## කුපන් අංකය 10

මුලකුරු සමග නම: ........................................................

ස්ථිර ලිපිනය: ........................................................

........................................................

දුරකථන අංකය: ........................................................

පුරුදු අත්සන: ........................................................

සණස සමිතියේ නම: ........................................................

........................................................

පිළිතුර: ........................................................


........................................................

# සුභ උපන්දිනයක් වේවා !!

## කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය



ආර්. විමලසිරි


ප්‍රෙමිලා ඩයස්


කේ.එච්. නන්දාවතී


එම්. සුරවිර


අයි. මුණසිංහ


එස්. අපෝන්සු


එන්. ප්‍රනාන්දු


එච්.ඩී. සිරිමති


චිත්‍රා ප්‍රනාන්දු


බී.ඩී. රසිකා


ආර්. ගෝමස්


කේ. දළුගම


සුධිර ජයනාත්

# ස.ණ.ස.

පුවත් කොළඹින්

2019 ඔක්තෝම්බර් කලාපය



## රන් කැකුළු ළමා සමාජය



සී.ස. උද්‍යාන සණස සමිතියේ රන් කැකුළු ළමා සමාජය වාර්ෂිකව පවත්වනු ලබන සීල සමාදාන වැඩසටහන අධ්‍යාපන කමිටුවේ මුලිකත්වයෙන් පසුගියදා පවත්වන ලදී.



රන් කැකුළු ළමා සමාජයේ චාරිකාව පසුගිය දිනක රිදී විහාරය, මෙරගහකන්ද, දඹුල්ල යන ස්ථාන නැරඹීම සහ වන්දනා කිරීම සඳහා අධ්‍යාපන කමිටුව විසින් සංවිධානය කරන ලදී.

**උද්‍යාන සණස - ගරු සභාපතිතුමා**



**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයෙකු මෙන්ම භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්ෂවරයකු වු**

## සංගමයේ සභාපතිගෙන්

ප්‍රශ්න විමසා පිලිතුරු ලබා ගන්න.

**ප්‍රශ්ණය** : සමිතියකට වියදම් දැරීමේ දී රිපිස්ට්‍රාර්ගේ අනුමැතිය ලබා ගත යුතු ද?

**පිළිතුර** : බස්නාහිර පළාත් ප්‍රඥප්තිය 33 වගන්තිය වෙළඳ බඩු නොවන චංචල දේපලක් අත්කර ගැනීමට හෝ විකිනීමට ලක්ෂයකට නොඅඩුව මහා සභාවට බලය ඇත. එසේ වුවද සමිතියේ පෙර වසරේ පිරිවැටුමින් සියයට එකක් හෝ ලක්ෂ පහක් හෝ යන දෙකෙන් අඩු ප්‍රමාණය දක්වා වූ වියදමක් මසකට එක් ගනුදෙනුවක් වන පරිදි රිපිස්ට්‍රාර්ගේ අවසරය නැතිව අත්කර ගැනීම, මිලට ගැනීම හෝ විකිණීම හෝ බැහැර කිරීමට කාරක සභාවට බලය ඇත. එම ගනුදෙනු පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ඊළග මහා සභාවට ඉදිරිපත් කල යුතුවේ.

නිශ්චල දේපලක් අත්කර ගැනීමට හෝ බැහැර කිරීමේ දී පෙර වසරේ වාර්ෂික පිරිවැටුමින් සියයට එකක් හෝ ලක්ෂ දහයක් යන දෙකෙන් අඩුමුදල දක්වා වටිනාකමක් ඇති වසරකට ගනුදෙනු තුනක් කිරීමට කාරක සභාවට බලය ඇත. එය පසුව එළඹෙන මහා සභාවට මෙන්ම මසක් ඇතුළත කොමසාරිස් වාර්තා කළ යුතු බවද නියතය.

**ප්‍රශ්ණය** : අතුරු ව්‍යවස්ථාවේ හා සමුපකාර නීතියේ විධානයන්ට පටහැනිව කටයුතු කිරීමට සමිතියට බලයක් නැද්ද?

**පිළිතුර** : නීතිවලින් හා ව්‍යවස්ථාවෙන් දැක්වෙන්නේ කාරක රීති අනුව කටයුතු කළ යුතු බව මෙන්ම බුද්ධිමත්ව කාරක කටයුතු කරනු ලබන බවය. යම් ලෙසකින් ඉහත නියමයන්ට පටහැනිට කටයුතු කළ හැකි අතර, එයින් අත්වන ප්‍රථිපලය විය යුත්තේ සමිතියට අලාභයක් හෝ පීඩාවක් නොවීම බව වග බලා ගෙන එසේ කිරීමට පසුබට විය යුතු නැත. වර්තමානයේ ඇති තත්වය අනුව අනුමැතිය ලබා ගැනීම ගත කරන ප්‍රමාදය නිසාම සමිතියට අත්කර ගත හැකි වාසිදායක තත්වයන් අහිමි කර ගත් ඇති අවස්ථා අප අත්දැක ඇත. කාරක සබාව මහා සභාවේ ද අනුමැතිය ගෙන යහපත් කටයුතු කිරීමට බුද්ධිය තිබිය යුතුය.

## තවත් ළමා දිනයක්

**සෑම** වසරකම ඔක්තෝම්බර් පළමුවනදා ලෝක ළමා දිනය සමරනවා. ඒ සෑම රටකම ජනගහනයෙන් වැඩි පිරිසක් ළමයින් වන නිසා ළමයා යනු මිනිසාගේ පියාය යනුවෙන් කියමනක්ද තිබේ. ඉදිරියට රටේ ජීවනාලිය වන්නේ අද ළමයායි. ඒ නිසා ඔහුට හෝ ඇයට හරි මගක යන්නට ගුරු හරුකම් දිය යුත්තේ පියා සෙනෙහසට හෝ මව් සෙනෙහසට වඩා වැඩි දයාවකිනි, ලෙන්ගතු කමකිනි. දසමසක් මව් කුස සිටිනා කාලයේදී පවා අපේ දරුවන් ආගමික වටපිටාවකට හුරු පුරුදු කරමින් අපේ ඇවතුම් පැවතුම් සංවරව පාලනය කරගත යුතු බව මව්වරුන් හොදාකාරව දන්නා දෙයක්. ඉදිරයේදී බිහිවන දරුවා යහපත් සිතුවිලි සමගම වැඩී රටකට බරක් නොවන කුල කුමරකු හෝ කුමරියක වනු දැක්ම කාගේත් එකම බලාපොරොත්තුවයි. විවිධ අපචාරී ක්‍රියාවන් අසන්නට, දකින්නට ලැබෙන මේ කාලයේ, හොඳ දරුවෙකු තැනීම, එහෙම නැතිනම් හොද පරම්පරාවක මුල් පුරුකයක් තැනීම ඉමහත් අමාරු ක්‍රියාවලියකි. හොද දේ බිලිබාගෙන නරක වපුරන්නට වෙර වෑයම් කරනා පිරිස් අපමනය. අපේ දරුවන් රැකගන්නට නම් පාසල් මට්ටමින්, ළමයින් ගැන අවධානයෙන් දවස පුරාම කටයුතු කළ යුතු කාලය පැමින ඇත.

නුතන සමාජයේ කාලය සමග මහා සටනක යෙදෙන වැඩිහිටියන් ගැන අප අනුකම්පා කල යුතුයි. මොහොතක හෝ විරාමයකට ඉඩ නොතබා හැල්මේ දිවයන ඔවුන් ජීවිතය සරිකර ලන්නට ගන්නා වෙහෙස ගැන අමුතුවෙන් කිවයුතු නොවේ. ඔබ බලන්න මොහොතක් බස්රථයක, දුම්රියක එහෙම නැතිනම් මහමග ගමන් කරනා අය ගැන. කඩිගුලක කඩියන් පිරිසක් ගැන ඔබට මතක්වේවි. ඒ සමගම අපේ දරුවන්ගේ මුහුණු ඒ අතරින් දිස්වේවි. අපට කොයි තරම් ප්‍රශ්ණ ආවත් ගෙදර සිටිනා පොඩි එකා ගැන සිහිවන්නේ ඒ නිසාය. හවසට ගෙදර යනවිට බනිස් ගෙඩියක් ගන්නේ ඒ නිසාය. අපි අපේ දරුවන්ට



ආදරය කරමු. අපේ ළමයිනට ආදරය කරමු. ළමයි කවදාහෝ දිනක අපට පෙරලා ආදරය කරාවි. නමුත් ඒ පෙරලා ආදරය එනතුරා බලා නොසිටිමු.

**ලක්ෂ්මන් ගුනවර්ධන පිටිපන නගර සණස වාර්තාකරු**

## සදා අමරණීය දම්පල් මැතිඳු

නැගී ආ පුන්සඳක් විලසින් දැයට එලියක් පතුරලා
සිහළ ජාතියෙ පිනට බිහිවූ මලක් ලෙස විකසිත වෙලා
දෙරණ ඉපදී සසුන රැකදී ගුණ සුවඳ ඇත පතුරලා
ගයමු දම්පල්තුමනි තුති ගී සැවොම ඔබෙ ගුණ සමරලා

මගේ රට මේ මගෙ ජාතිය මගේ බසයයි පවසමින්
අගේ ඇති හෙල සිරිත් රැකගත යුතුව ඇත දැයටම පෙමින්
පරසිරිත් කරපින්න ගෙන ගිය මම් ඩැඩී කිවුහට තදින්
සිටිය දම්පල් වීරයා අප රටම රැක දුන්නා සොදින්

කරත්තයකින් රට වටේ ගොස් දනන් ඇමතුව හරි අගෙයි
කන්නෙ ගවමස් රොඩිය යනුවෙන් පහර දුන්හැටි හරි අගෙයි
සුරාපානය ධන විනාසෙට මුලය පැවසු හැටි අගෙයි
මැතිඳු ඕල්කට්තුමා සමගින් සටන ගෙනගිය හරි අගෙයි

වැටීසිටි අප සිහළ ජාතිය නගාසිටුවේ ඔබ තුමයි
පරාධීනව පෙළුන ජනයා අවදිකෙරුවේ ඔබ තුමයි
බුදුන් දෙසු බණ අපගෙ හදවත් තුලට ගෙනගියෙ ඔබ තුමයි
දැයට දැල්වුන පහන් සිලවිය සවන් රැදුනේ ඔබෙ නමයි

උදාරයි ඔබ උදාරයි ඔබ වීරයානෙනි අමරණීයයි
නැගූකාහල නාදෙ තවමත් සවන් රැවුදෙයි අමරණීයයි
සසුන රැකදී සිහළ දේශය නැගු හැටි ඔබ අමරණීයයි
පතමු දම්පල් තුමනි අපි සැම නිවන්සුව ඔබ අමරනීයයි

**නිමල් වික්‍රරත්න - ඉහල බෝමිරිය සණස**

ජාතක කතා පොතෙන්

## මූලපරියාය ජාතකය

බමුණු කුලයේ ඉපදි බෝසත්, එදා ඇදුරුව සිල්ප දුන්නේ
දිසාපාමොක් නමින් එදවස වේදතුන පරතෙරට යන්නේ
සියළු අතවැසි ගෝල බාලැති හැමට එකසේ මංත්‍ර දෙන්නේ
ශිල්ප දැනගත් පසුව හැමදෙන, මානයෙන් මත්වී තැවෙන්නේ

අපි උගෙන දත් ශිල්ප පමණයි, ඇදුරුතුම නැහැ වෙනත් දන්නේ
එසේ සිතමින් ඇදුරු නොතකා, වතාවත් නැහැ ඔහුට දෙන්නේ
ඇදුරු තනිවම ඩෙබර ගසයට ගිමන් නිවමින් කල් මරන්නේ
මෙදැක සිසුවන් ඔහු වටාගොස් වංචනික අදහස් කියන්නේ

නියනකින් විද ඩෙබරයේ කද, කියයි මේ ලෙස ඇදුරුවන් හට
කදෙහි හරයක් නොමැත දැකුමට ඔබත් පිළිගනු ඇතැයි සිතුමට
මමත් ඔබගෙන් අසමි පැනයක්, දෙන්න පිළිතුරු සැනින් මා හට
සත් දිනක් කල් දුන් ඇදුරු තෙම, බලා සිටියේ ගෝල රෑනට

ඩෙබර ගසකට සමානව ගෙන, ඇදුරුතුම පහතට හෙලීමෙන්
ගෝලයින්ගේ දැනුම මදබව පෙන්වමින් ඉදිරියට ඒමෙන්
පිළිතුරක් නැත ලබාදුන්නේ, කමා කරමින් නිහඬ වීමෙන්
එහෙත් අවසන දෙපා නැම හැම බෝසතානන් පිළිගැනීමෙන්

දහම් අරුතකි මතුව එන්නේ යොවුන් බව මඩමින් ගෙවීලා
උදය, සවසද කාල රාමුව සත්වයින් හා නිති බැදීලා
නසා තන්හා ගෙවු කාලය පිරුණු ගෙඩි ඇති ගසක් වීලා
සසර දිවිමග කෙළවරක් දැක අදුර දුරලමු, එළිය දීලා

*උපදේශයඃ තණ්හාව නැතිකල තැනැත්තා විසින් කාලයෙන් ප්‍රයෝජන ලබයි.*

*-සිරි-*

*මානව වර්ගයාගේ උපතේ සිට මරණය තෙක්, ජීවත්වීමේ හරය වන්නේ සමුපකාරයයි.*

01 පිටුවෙන්...

## සමුපකාරයේ සියලුම වැඩ ගැන බලය තියෙන්නේ සාමාජිකයින්ගෙන් යුත් මහා සභාවටය.

51 ප්‍රශ්ණය - සමාගම අයිති කාට ද?
උත්තරය - සියලුම සාමාජිකයන්ටය.

52 ප්‍රශ්ණය - ආණ්ඩුවට එහි අයිතිවාසිකමෙන් කොටසක් නැද්ද?
උත්තරය - නැත. කිසිම අයිතියක් නැත.

53 ප්‍රශ්ණය - ගම්මුලාදෑනියෙකුට හෝ ආණ්ඩුවේ අන්‍ය මුලාදෑනියෙකුට එක්සත් සහකාර සමාගමක සාමාජිකයෙක් විය හැකිද?
උත්තරය - පුලුවන. ඒ පුලුවන්කම තියෙන්නේ අන්‍ය සාමාජිකයෝ ඔහු අදුනන නිසාත්, විශ්වාස කරණ නිසාත් මිස ඔහු ආණ්ඩුවේ මුලාදෑනියෙක් නිසා නොවේය.

54 ප්‍රශ්ණය - එසේ නම් එවැනි මුලාදෑනි පත්කර ගත්තාට අන්තරාවක් නැද්ද?
උත්තරය - අන්තරාවක් තිබේ. ඔහුට විරුද්ධව යමක් කීමට හයතරම්වේ. ඔහුගේ ණය ඉල්ලුම් පත්‍රය ගැන ගුණ දොස් දක්වන්ට බැරිතරම් ද අන්තිමට ඔහු සමාගමේ අනික් සාමාජිකයන්ට වැඩිය බලපුලුවන් කමින් උගත්කමින්, ධනවත්කමින් උසස්ව සිටියේ නම් ඔහු පත් කර ගැනීමෙන් සමාගමේ සමානත්වයකින් වැඩ කිරිමේ ගුණාන්ගය ද සහකාර ප්‍රතිපත්ති මත වැඩ කිරිම ද නැතිවේ.

55 ප්‍රශ්ණය - සමාගමේ වැඩ ගැන සම්පූර්ණ බලය තියෙන්නේ කා අතේ ද?
උත්තරය - සියලුම සාමාජිකයින් යුත් මහ සභාවේය.

56 ප්‍රශ්ණය - රිජිස්ට්‍රාර් උන්නාන්සේට නොවේ ද?
උත්තරය - සත්තකටම නොවේය. රිජිස්ට්‍රාර් උන්නාන්සේ හා උන්නාන්සේ ගේ මුලාදෑනි සමාගමට උගන්වති. දැනමුතුකම් කියා දෙති. උපකාර කරත්. නුමුත් ඔවුන් සාමාජිකයෝ නොවෙත්. ඔවුන් විසින් දෙන දැනමුතුකම් පිට පිළිපදින්ටෙයි කියා බලහත්කාරකම් කරන්නට ද ඔවුන්ට බලයක් නැත.

57 ප්‍රශ්ණය - එසේ නම් රිජිස්ට්‍රාර් උන්නාන්සේට කිසිම බලයක් නැද්ද?
උත්තරය - රිජිස්ට්‍රාර් උන්නාන්සේ පළමුවෙන් සමාගමක් ලියාපදිංචි කිරිමට සෑහේ ද කියා තීන්දු කරනවා ඇත. ගණන් හිලව් පරික්ෂා කිරීමට බලය තිබේ. සහකාර ප්‍රතිපත්තිපිට වැඩ නොකරණ සමාගමක් අවලංගු කිරීමට ද බලය තිබේ. එවිට උතුමාණන් වහන්සේට ඒ ගැන මැදිහත්වීමට ඉල්ලා සිටීමට සමාගමට බලය තිබේ. නමුත් සමාගමේ අභ්‍යන්තර වැඩකිරිම ගැන උන්නාන්සේට බලයක් නැත. උන්නාන්සේට දැනමුතුකම් දීමට පුලුවන. නමුත් නායකයෙක් ලෙස මෙසේ කරන්නට කියා බල කිරිමක් නැත.

**වාර්තාව සකස් කලේ**
**සණස සම්පත් කළමනාකරන සමුපකාර මහා සංගමයේ ගරු සභාපති**
**සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය විසිනි**

## සුවදායී ජීවිතයක් ගත කරමු

වර්තමාන සමාජය බොහෝ කර්යබහුලය. එම නිසා ඔවුන්ට ප්‍රශ්නද වැඩිය. ඒ නිසා වැඩි දෙනෙක් මානසික ආතතිය, හෘද රෝග, දියවැඩියාව වැනි බෝ නොවන රෝගයටද ගොදුරු වේ.

මෙම කාර්යබහුලත්වය වැඩි වී තිබෙන්නේ මුදල් සෙවීමේ නොනවතින ආශාව නිසයි. අත්‍යවශ්‍ය කාර්යයන් සදහා නොව සමාජයේ ඉහලින් වැජඹීමට මුදල් අවශ්‍යතාවයටයි. විශාල ගෙයක් වාහනයක්, නොයෙකුත් මාදිලියේ විසිතුරු භාණ්ඩ, අධික මිල ඇති ඇදුම් ආයිත්තම් ආදියට ඇති ආශාවටයි. සමහර විට මේවා ලඟාකර ගැනීමට ණය වෙන්නට සිදුවෙයි. ණය ගෙවීමට යහමින් මුදල් අවශ්‍යය නිසා දිවා රෑ වෙහෙසෙයි. හරියට කෑමක් බීමක් නැත. නිදාගැනීමක් නැත. ඉතින් ලෙඩ වෙන්නේ නැද්ද?

ඔබත් මෙවැනි පුද්ගලයෙක් දැයි සිතා බලන්න. නිරෝගිමත් ජීවිතයක ඇති වටිනාකම තේරුම් ගන්න. තමාට හැකි පමනින් සිතිවිලි වලට වහල් නොවී සන්සුන් ජීවිතයක් ගත කිරීමට උත්සාහ ගන්න. රෝගී වී ජීවිතය ගෙවනවාට වඩා නිරෝගී සුවදායී ජීවිතය යහපත් වනු ඇත.

**සන්ධ්‍යා ජයකොඩි**
**පිටිපන නගරය සණස**



## මව්ක ඇගය

**ඇම්. රිචඩ් පෙරේරා**
**සණස නැදිමාල**

හිමිදිරියේ සිටම නියමිත වැඩ    කොටස
නිමකරලන්න නොතකා මතුවෙන    වෙහෙස
ඉරබැස යන්න පළමුව ගතකර    දවස
ඇය අරගනී තත්පරෙ මෙහෙවර    පිණිස

ලේ කිරිපොවා දරුවා සෙනෙහසින්    දැඩී
කැතකුණු අතගගා පැටි අවධියෙදි    පොඩී
මව් පදවියෙන් නංවාගෙන විජය    කොඩී
පෙරමුණ සිටී ඇය බඹ ගණනකින්    අඩී

සිත ගත වැඩුනු පසු ලොව ගැහැණියක්    ලෙස
සළකති කුසලක්ය පුදලද පුදුම    යස
සැකසෙන උකුල බිළිඳුට තම යහන    මිස
සුවයක් නොමැත සවනට දේ කවිය    රස

මව්වරු කොතෙක් සිටියත් හැම තැනක    රටේ
දරුවා දනී රාවය තම මවගෙ    කටේ
පවතී ලේ සුවඳ පාවෙන පවන    වටේ
සංවේදීව දැන නෙත් යුග කදුළු    වැටේ

නාමල් රෝස වතුසුදු අරලිය    සුවඳ
හැඳිනිය හැකිය කොතැනත්, කොහොමත්    නිබඳ
මවගේ බුලත් හපයක සෙනෙහස    කිම්ද
දරුවෝ දනිති නොකියන මුත් කට    දිවද

මව කරතබා දැඩි අදිටන අනුව    හිතේ
වෙරළට පැමිණි පසු වෙහෙසින් යුතුව    ගතේ
එක්වර දෑත් නගමින් පිස කඳුළු    නෙතේ
මව කීවාය උඹ මතු බුදු වෙයන්    පුතේ

01 පිටුවෙන්...



## 63 වන සංවත්සරය සැමරූ වගයි.

**2019 වසරේ නව නිලධාරි මණ්ඩලය**

| | |
|---|---|
| **ගරු සභාපතිණි** | : නිලානි ගුරුගේ |
| **ගරු උපසභාපතිණි** | : ජයන්ති මාරසිංහ |
| **ගරු ලේකම්** | : වසන්තා කොළඹගේ |
| **ගරු භාණ්ඩාගාරික** | : පී.ඩබ්.ආර්.සී. වඩුසිංහආරච්චි |
| **ගරු කාරකසභික** | : සුභද්‍රා පෙරේරා, කමනි ගමගේ, තුෂාරි සඳමාලි, නිල්මිනි වාසනා, ජයන්ති රණවීර |
| **කාන්තා කමිටු සභාපතිණි** | : සමන් පුෂ්පිකා |
| **විගණන කමිටුව** | : ඩෙල්සි මුතුමාල, ආර්.ඒ.ඩී. ලක්ෂ්මී, සමුද්‍රිකා ජයරත්න |

**නිලානි ගුරුගේ - ගරු සභාපති**

## තාක්ෂණයේ දියුණුව

මවගේ කුසෙන් එළි දුටු තෙමසෙන්    පසුව
දුරකථනයක් දිය යුතු යැයි කල්    මැරුව
අද පෙර පාසලට යන්නට පෙරා    තුව
ලැප්ටොප් රැගෙන දෙන්නේ කෙළෙසද    සිතුව

මෙයට දශක හතඅටකට පෙර    කාලේ
අපෙ වැඩිහිටි අයත් ඉගෙනුම ලැබූ    කාලේ
එක, දෙක, තුනය කියලා හය හැදු    කාලේ
අද ඇති ගණක යන්ත්‍රිය නැහැ ඒ    කාලේ

නිරවුල් මනසකින් හොඳ හැටි පොත්    කියවා
කියමු හැම දෙයක් මත් මතකයේ    රැදුවා
පාසල් දිවියෙ හිනි පෙත්තට පිය    නැගුවා
අද වගෙ පරිගණක යන්ත්‍රය එහි    නැතුවා

අධ්‍යාපනයට ම නැති නම් වෙන    දෙයට
හොද හොද පොත් කියවලා තේරුම්    ගැනීමට
ඒ කාලයේ අපෙ වැඩිහිටි දෙනා    හට
ඉන්ටනෙට් තිබුණේ නැත රටා    වට

ළමයා කුඩා අවධියේ සිටම හොද දැනුමක්    ඇතිව
යනවා යයි ඉදිරියට මව්පියෝ සිත    ඇතිව
ඉල්ලු සැම දෙයක් දෙයි තම අත ශත පහ    නැතිව
සමහර ළමයි අවසානයෙ ගෙට වෙයි කිසිවක්    නැතිව

ස්මාර්ට් ෆොන් එක පළමුව අත    නැතිව
ගණක, පරිගණක, ලැප්ටොප් එක    නැතිව
ඉමෝ, ඉන්ටනෙට්, වට්ස්ඇප් එක    නැතිව
වැඩිදුර අධ්‍යාපනය කෙලෙසද අප    සතුව

එදා අපේ වැඩිහිටි අය ඉගෙනගත්ත වගක්    නැතිව
හොදින් ඉගෙනගත්ත සැවොම මේ කිසිවක් සිතන්    නැතිව
ආචාර, මහාචාර, විශාරද උපාධි පට්ටනුත්    ඇතිව
සමාජයට හොඳ සේවය දෙයි කිසිවක් අඩුම    නැතිව

දුරකථනය ලැබුන පසුව අද කාලේ අපේ    ළමයි
තුන් තිස්පැයෙ දුරකථනයෙ ඉන්නේ ඇති    ඔබාගෙනයි
හොද නරකට, නරක හොඳට පෙනෙනා මේ අපේ    ළමයි
ජීවිතයම නැති කරගෙන අනාගතය අනාථ    වෙයි



**බී.කේ. පද්මිනි**
**ගාල්ල දිස්ත්‍රික් සණස සංගමය**
**වැලිවිටිය දිවිතුර කලාපය**
**කළමණාකරු**

## සැබෑවූ සිහිනය

කාලය ගතවී වසර විසිහතරක්    වෙනවා
සිහින සැබැවී දෙනෙතට තුටු කදුලැලි    එනවා
කාර්‍යඵලෙන් කලාපෙ අපි මුල්තැන    එනවා
සභාපතිතුමනි ගරු, ඔබෙ ගුණ අපි    සමරනවා

කාලය කැපකරන්නේ සණසට ඔබ සීමාවක්    නැතුවයි
ඒ කැපකෙරුම මල්ඵල ගැන්වී ඇති    පාටයි
සම්මානෙ 'බී' ලැබුණු හේතුව    ඒකයි
ගැසු ගල්මුගුරු අද ඔබෙ පාමුල    ගාවයි

**නන්දනී හෙට්ටිආරච්චි - පැපිලියාන සණස**

# සී.ස. පැපිලියාන සණස
## 24 වන සංවත්සරය සැමරූ වගයි.

සී.ස. පැපිලියාන සමිතියේ 24 වන සංවත්සර මහා සභාව පසුගියදා සුජිත් කුමාර උත්සව ශාලාවේදී උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. මෙයට සමගාමීව සණස පරිශ්‍රයේ සිට අටවිසි බුද්ධ පූජාව අලංකාර පෙරහැරක් මගින් පැපිලියාන සුනේත්‍රාදේවි රජමහා විහාරයට වැඩම කරවිය.

සංවත්සරය සඳහා ආරාධිත අමුත්තන් ලෙස දිසා සංගම් හිටපු අධ්‍යක්ෂ එච්. බෙනරගම මහතා, දොඩම්ගොඩ කලාපයේ සභාපති කේ. චමින්ද විරප්පෙරුම මහතා, කලාප සම්බන්ධිකරණ ලේකම් කේ. චන්ද්‍රසිරි මහතා යන අය සහභාගි විය.

ආරාධිත අමුත්තන් විසින් සමිතියේ වර්තමාන තත්වය ගැන සතුට පල කරමින් හරවත් දේශණ පැවැත්වීමෙන් අනතුරුව සියලු දෙනා පිනවමින් පිපෙන කැකුළු ළමා කමිටු දරුවන්ගේ නර්තන අංගයක් ඉදිරිපත් කරන ලදී. නර්තනයට සහභාගි වූ දරුවන් හට තිළිණ ප්‍රධානය කරන ලදී. මෙහිදී මෙම නර්තන අංගය පුහුණු කටයුතු වලට වෙහෙසවූ කාන්තා කමිටුවේ සාමාජිකයින් හට සභාපතිතුමා විශේෂ ස්තූතියක් පුද කරන ලදී, ඉන් අනතුරුව නොකඩවා සමිතියට පැමිණි සාමාජික සාමාජිකාවන්ට තිළිණ ප්‍රධානය කරන ලදී. සියලුදෙනාට දිවා ආහාර ලබාදීමෙන් පසු සංවත්සරයේ වැඩ කටයුතු නිමාවිය.

**2019-2020 වසරේ නව නිලධාරි මණ්ඩලය**

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | එම්.එම්. සුජිත් කුමාර |
| ගරු උපසභාපති | : | එච්. ප්‍රියන්ත කුමාර |
| ගරු ලේකම් | : | දමයන්ති සුමනමාලි වික්‍රමසේකර |
| ගරු භාණ්ඩාගාරික | : | පී.ආර්. හිරෝෂිමා දිල්රුක්ෂි |
| ගරු කාරකසභික | : | ඒ.එම්. සුමනාවති, ඒ.කේ. යුරේෂා, ආර්.පී. සමන්ති |


පූජ්‍ය සුමනධම්ම ස්වාමීන්ගේ අනුශාසනාව


වාර්ෂික අටවිසි පූජාව


ගරු සභාපතිතුමා සභාව අමතමින්


පැමිණි ආරාධිත අමුත්තන්


සංවත්සරයට සහභාගි වූ සාමාජිකයින්


ළමා කමිටු නර්තනය


12/12 ට පැමිණි 48ට ත්‍යාග ලබාදීම.


නර්තනයට සහභාගිවූ දරුවන්ට ත්‍යාග ලබාදීම


ගරු සභාපතිතුමා ඇතුළු නව අධ්‍යක්ෂ මණ්ඩලය


සංවත්සරය අවසානයේ රසවත් දිවා ආහාරයක්

එච්.එම්. සසිකා ශයානි පෙරේරා
පැපිලියාන සණස